# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1074/7 - 1999 අප්‍රේල් 07 වැනි බදාදා - 1999.04.07

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 7/98.

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

38 වන වගන්තිය යටතේ නියෝග

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ 5 වන වගන්තිය සහ ඒ පනතේ උපලේඛනය සමග කියවිය යුතු එකී පනතේ 38 වන වගන්තිය යටතේ ජනාධිපතිනිය විසින් සාදන ලද නියෝග.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

1999 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 1999 අංක 1 දරන ලැයිස්තුගත නොවූ සමාගම් නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ පිළිවෙලින් 2 වන හා 3 වන වගන්ති යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනත යටතේ බලපත්‍ර දෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත නොවූ -

   (අ) වර්ෂයකට රුපියල් මිලියන පන්සියයක් ඉක්මවන පිරිවැටුමක් ඇත්තා වූ සෑම සමාගමකට ද ;

   (ආ) ඉකුත් වූ මුදල් වර්ෂය අවසානයේ දී රුපියල් මිලියන එක් සියයක් ඉක්මවන කොටස් හිමියන්ගේ සම කොටස් ප්‍රමාණයක් පැවතියා වූ සෑම සමාගමකට ද ;

   (ඇ) ඉකුත් වූ මුදල් වර්ෂය අවසානයේදී රුපියල් මිලියන තුන්සියයක් ඉක්මවන මුළු වත්කම් පැවතියා වූ සෑම සමාගමකට ද ;

   (ඈ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේ දී බැංකුවලට සහ වෙනත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන එක් සියයක් ඉක්මවන බැරකම් පැවතියා වූ සෑම සමාගමකට ද ;

   (ඉ) තැනැත්තන් එක් දහසකට වැඩි කාර්ය මණ්ඩලයක් ඇති සෑම සමාගමකට ද ;

අදාළ විය යුතුය.


04-469

I A — H 2943—830 (99/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී